www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා නාවික කඳවුරේ අන දෙන නිලධාරියා සසප සාමාජිකයා අතුරුදහන් වීම පිලිබඳ පරීක්ෂනයට බාධා කරයි

## Sri Lankan navy commander stonewalls inquiry into disappearance of SEP member

**අපේ වාර්තාකරුවන් විසිනි**
**2007 අගෝස්තු 17**

උතුරු ශ්‍රී ලංකාවේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් අතුරුදහන් වීමේ සිද්ධිය සම්බන්ධ සිත් කලඹන නව වර්ධනයක් සනිටුහන් කරමින්, නාවික කඳවුරක අන දෙන නිලධාරියෙක් මූලික මාර්ග බාධකයක අදාල අවස්ථාවේ රාජකාරියේ යෙදී සිටි නිලධාරින් පිලිබඳ විස්තර සැපයීම කෙලින් ම ප්‍රතික්ෂේප කර තිබේ.

විමලේස්වරන් හා මදිවදනන් අවසන් වරට දකින ලද්දේ මාර්තු 22 දා යාබද පුංගුඩුතිව් දිවයිනේ සිට දිග මුහුදු පාලමක් ඔස්සේ කයිට්ස් දිවයිනේ මාර්ග බාධකය දෙසට යතුරු පැදියකින් ගමන් කරමින් සිටිය දී ය. ඔවුන් දෙදෙනා එදින රාත්‍රියේ පැවැත්වෙන විවාහ මංගල උත්සවයකට සහභාගි වනු පිනිස පුංගුඩුතිව් දිවයිනෙන් අවශ්‍ය ඇඳුම් කිහිපයක් රැගෙන ආපසු කයිට්ස් බලා පැමිනෙමින් සිටියහ.

මෙම උතුරු දිවයින් ප්‍රදේශය පුරා දැඩි මුරකාවලේ යෙදෙන නාවික හමුදාව මුහුදු පාලම දෙකෙලවරේ ම සෝදිසි මුර පොලවල් පවත්වා ගෙන යයි. විමලේස්වරන් හා මදිවදනන් සවස 5.30ට පමන කයිට්ස්හි වේලනෙයි පිවිසුම් ස්ථානයේ ද ඉන් පසුව සවස 6.30ට පමන පුංගුඩුතිව් නාවික හමුදා සෝදිසි මුර පොලේ දී වේලෙනෙයි කරා ආපසු පැමිනෙනු පිනිස යතුරු පැදිය යලි පන ගන්වමින් ද සිටි අයුරු දැක තිබේ. මුහුදු පාලම මත දී වෙනත් දිශාවකට යා නොහැකි තතු යටතේ මොවුන් දෙදෙනා මද වේලාවකට පසුව වේලනෙයි සෝදිසි මුර පොල වෙත ලඟා විය යුතුව තිබුනි.

අගෝස්තු 3 දා කයිට්ස් දිවයිනේ මහේස්ත්‍රාත් උසාවියේ පැවති නඩු විභාගයක දී පොලීසිය කියා සිටියේ මුහුදු පාලමට ප්‍රවේශ වන ස්ථානයේ මාර්ග බාධකයක් පවතින බව පවා කංචදේව නොහොත් වේලනෙයි නාවික හමුදා කඳවුර භාර අන දෙන නිලධාරියා ප්‍රතික්ෂේප කරන බව යි. කයිට්ස් පොලීසිය වේලෙනෙයි හා පුංගුඩුතිව් කඳවුරුවල අන දෙන නිලධාරින්ගෙන් කරුනු විමසීම නැවත නැවතත් මහ හැර තිබූ අතර අවසානයේ ක්‍රියාත්මක වූයේ ඊට පෙර ජුලි 27 දා පැවති නඩු විභාගයක දී සාක්ෂ්‍යකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලෙස නියෝග කරනු ලැබීමෙන් පසුව පමනි.

කයිට්ස් පොලීසියේ උප පොලිස් පරීක්ෂක සරනපාල සිය මූලස්ථාන පොලිස් පරීක්ෂක එවූ ලිපියක් උසාවියට ඉදිරිපත් කල අතර එහි මෙසේ සඳහන් විය: “පැමිනිලිකාරියගේ නැවත ප්‍රකාශයේ සඳහන් වූ වේලනෙයිතුරෙයි මාර්ග බාධකයේ නිලධාරින් කයිට්ස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලෙසට දන්වා කංචදේව අන දෙන නිලධාරි වෙත දැනුම් දුන්න ද අන දෙන නිලධාරි විසින් සඳහන් කර ඇති ස්ථානයේ මාර්ග බාධකයක් පවත්වා ගෙන නොයන බවට මා වෙත දන්වා ඇත.”

නිලධාරියාගේ කියාපෑම තනිකරම බොරුවකි. පොලීසියට දුන් ප්‍රකාශයක දී, විමලේස්වරන්ගේ සොයුරිය වන චිත්‍රකුමාර් ජයචිත්‍රා සඳහන් කලේ තමා සිය සැමියා සමග පුංගුඩුතිව් සිට ආපසු එමින් සිටිය දී සවස 5.00ට පමන වේලනෙයි සෝදිසි මුර පොලේ දී විමලේස්වරන් හා මදිවදනන් දුටු බව යි. ඔවුන් දෙදෙනා නාවික හමුදා නිලධාරින් විසින් ශරීර පරීක්ෂාවකට ද සිවිල් ඇඳුමින් සැරසුනු ඔත්තු සේවා නිලධාරින් දෙදෙනකු විසින් ප්‍රශ්න කිරීමකට ද ලක් කෙරෙන අයුරු ඇය දුටුවා ය.

ජයචිත්‍රාගේ මෙන් ම විමලේස්වරන් හා මදිවදනන් කයිට්ස් දෙසට වැටුනු මුහුදු පාලම දෙසට යාමට ප්‍රථම පුංගුඩුතිව් සෝදිසි මුර පොලේ දී සිය යතුරු පැදිය යලි පන ගන්වමින් සිටිනවා දුටු අරුල් නමින් ද ප්‍රසිද්ධ සෙල්වදුරෙයි රන්ජුතන්ගේ ද ප්‍රකාශ මූලස්ථාන පොලිස් පරීක්ෂකගේ ලිපිය මගින් නොතකා හැර තිබේ.“ මෙම අයගේ ප්‍රකාශයන්ගෙන් ද අතුරුදහන් වූ අය සම්බන්ධයෙන් නිසි තොරතුරක් අනාවරනය නොවීය.” යැයි ලිපිය සඳහන් කලේ ය.

වේලනෙයි අන දෙන නිලධාරියාගේ ප්‍රකාශයට නරුම ඇඟවුම් පවතී. ඔහුගේ නිලධාරින්ට විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් කිසිදු සම්බන්ධයක් නැති නම් මූලික තොරතුරු සැපයීමෙහි ලා ඔහු කිසිදු පැකිලීමක් නොදැක්විය යුතුව තිබුනි.

පුංගුඩුතිව්හි අන දෙන නිලධාරියාට ලොග් පොත් පරීක්ෂා කර බලා ඔවුන් දෙදෙනා දිවයිනට ඇතුලු වී පිටව ගොස් ඇති බව සසපට දැනුම් දීමට කිසිදු අපහසුතාවක් නොවීය.

මාර්ග බාධකයක් පැවතීම නිර්භයට ප්‍රතික්ෂේප කිරීම මගින්, වේලනෙයි අන දෙන නිලධාරියා උත්සාහ කරන්නේ සිය නිලධාරින් කිසිදු ප්‍රශ්න කිරීමකට ලක් කිරීම හෝ කිසි යම් ලොග් පොතක් පරීක්ෂාවට ලක් කිරීම වලක්වාලීමට යි. පොලීසියේ ප්‍රතිචාරය පෙන්නුම් කරන්නේ, මිනිසුන් දෙදෙනාගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් කිසිදු බැරෑරුම් පරීක්ෂනයක් පවත්වනවා වෙනුවට ආරක්ෂක හමුදාවන්ගේ ක්‍රියාකාරකම් යට ගැසීමට ඔවුන් වඩා උනන්දු බව යි. එදින එහි නාවික හමුදා මාර්ග බාධකයක් පැවති බව ප්‍රදේශයේ ගැමියන්ගෙන් කෙරෙන සරල විමසීමකින් තහවුරු වනු ඇත.

පුද්ගලයන් දෙදෙනාගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් තමන්ට පැමිනිල්ලක් ලැබුනු බව පොලීසියට කල ප්‍රකාශයක දී පිලිගත් පුංගුඩුතිව් නාවික අන දෙන නිලධාරි විපුල හේමන්ත පීරිස්ගෙන් වැඩි දුර ප්‍රශ්න කිරීමට ද පොලීසිය ක්‍රියා කොට නැත. "පැමිනිල්ල සම්බන්ධයෙන් පරීක්ෂන පැවැත්වුව ද අතුරුදහන් වූ දෙදෙනා සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් දැන ගැනීමට නොහැකි වූ බව" පීරිස් පොලීසියට දැනුම් දුන්නේ යයි මූලස්ථාන පොලිස් පරීක්ෂක මහේස්ත්‍රාත්වරයා වෙත එවූ ලිපියේ සඳහන් වේ.

විනිසුරු අසුනේ සිටි මහේස්ත්‍රාත්වරයා එම ලිපියේ අන්තර්ගතය පිලිගැනීම ප්‍රතික්ෂේප කරමින් අගෝස්තු 24 දා උසාවිය හමුවේ පෙනී සිටින ලෙස වේලනෙයි අන දෙන නිලධාරියාට නියෝග කලේ ය. පොලීසියේ හා නාවික හමුදාවේ මග හැරීමේ උපායන්හි ප්‍රතිඵලයක් ලෙස මෙම නඩුව දැන් මාස තුනකට ආසන්න කාලයක් තිස්සේ දිගට ඇදෙමින් පවතී. පොලීසිය අතුරුදහන් වීම ගැන පරීක්ෂන පැවැත්වීමෙහි ලා කිසිදු ස්වාධීන පියවරක් වාර්තා කර නැති අතර සසප විසින් අනාවරනය කරනු ලැබ ඇති තොරතුරු හඹා යාමට ද අපොහොසත්ව ඇත.

ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිය වර්ගවාදී යුද්ධය යලි ඇරඹීමෙන් පසුව පසුගිය වසර තිස්සේ සිදුව ඇති අතුරුදහන් වීම්, පැහැර ගැනීම් හා ඝාතන සිය ගනනක් සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවන්ට චෝදනා එල්ල වී තිබේ. දේශීයව හා ජාත්‍යන්තරව පැන නැග ඇති විවේචන සම්බන්ධයෙන් වඩ වඩා නොසන්සුන් බවට පත්ව ඇති රාජ්‍ය යන්ත්‍රනය මිලිටරියේ සහභාගිත්වය යට ගැසීමෙහි ලා මංමුලා සහගත වී ඇත. මෙම සිද්ධීන්ගෙන් එකක දී වත් කිසිවෙකුට හෝ එරෙහිව චෝදනා ගොනු කෙරී නැති තරම් ය.

එක්සත් ජනපදයේ පාදක හියුමන් රයිට්ස් වොච් (එච්ආර්ඩබ්ලිව්) සංවිධානය පසුගිය සතියේ නිකුත් කල වාර්තාවකට අනුව, දිවයිනේ උතුරේ හා නැගෙනහිර මෙන් ම කොලඹ අගනුවර ද 2006 ජනවාරි සිට 2007 ජූනි දක්වා පැහැර ගැනීම් 1,100කට වඩා වාර්තා වී ඇත. එච්ආර්ඩබ්ලිව් ආසියානු අධ්‍යක්ෂ බ්‍රැඩ් ඇඩම්ස් මාධ්‍යවලට මෙසේ පැවසී ය: "ශ්‍රී ලංකා ආන්ඩුව සිය ආරක්ෂක හමුදාවන්ට කැත යුද්ධ උපායන් යොදා ගැනීමට කොල ආලෝක සංඥාව ලබා දී ඇති බවක් පෙනී යයි. එල්ටීටීඊය විසින් කරනු ලබන උල්ලංඝනයන් ආන්ඩුවේ ඝාතන, අතුරුදහන් වීම් හා අවතැන් වූවන් බලාත්කාරයෙන් ආපසු යැවීමේ ව්‍යාපාරය සඳහා සමාවට කාරනාවක් නොවේ."

පසුගිය සතියේ ශ්‍රී ලංකාවට කල සංචාරයක දී, එක්සත් ජාතීන්ගේ මානුෂික කටයුතු පිලිබඳ උප ලේකම් ජෝන් හොල්ම්ස් *රොයිටර්* ප්‍රවෘත්ති සේවය සමග අදහස් දක්මින් කියා සිටියේ ආධාර සේවකයන් සඳහා මෙරට ඉතා භයානක තැනක් බව යි. පසුගිය මාස 18 තුල -- එනම් ජනාධිපති මහින්ද රාජපක්ෂ බලයට පැමිනීමෙන් පසුව -- ආධාර සේවකයන් 30ක් ඝාතනයට ලක්ව ඇති බව ඔහු පෙන්වා දුන්නේ ය. සෙසු ආධාර ඒජන්සි මෙම සංඛ්‍යාව 34ක් ලෙස සඳහන් කරයි.

එල්ටීටීඊයට පක්ෂපාතී වීම සහ ආරක්ෂක හමුදාවන්ගේ හා "ආන්ඩුවේ ප්‍රතිරූපයට හානි කිරීම" සම්බන්ධයෙන් ආන්ඩුව එච්ආර්ඩබ්ලිව් සංවිධානයට හා හොල්ම්ස්ට වහාම පහර ගැසී ය. හොල්ම්ස් එල්ටීටීඊයෙන් අල්ලසක් ලබා ගෙන ශ්‍රී ලංකාවේ කීර්තියට හානි කිරීමට හිතාමතා ම උත්සාහ කරන බවට තමා විශ්වාස කරන්නේ යැයි ආන්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මාධ්‍යවලට පැවසී ය. "අපි සලකන්නේ ත්‍රස්තවාදීන්ට උදව් කරන අය ද ත්‍රස්තවාදීන් ලෙස යි. එබැවින් එල්ටීටීඊයට උදව් කරන හොල්ම්ස් ද ත්‍රස්තවාදියෙකි." යැයි ඔහු ප්‍රකාශ කලේ ය.

එවන් හෙලා දැකීම්වල උමතු ස්වභාවය මගින් සරලව ම තහවුරු වන්නේ ආන්ඩුවට සැඟවීමට බොහෝ දේ තිබෙන බව යි. එච්ආර්ඩබ්ලිව් හෝ හොල්ම්ස් විසින් ඉදිරිපත් කරන ලද කරුනුවලට අභියෝග කිරීමට එය කිසිදු ප්‍රයත්නයක් දරා නැත.

විමලේස්වරන් හා මදිවදනන් සොයා ගැනීමට වහාම පරීක්ෂනයක් පවත්වා ඔවුන් නිරුපද්‍රිතව නිදහස් කිරීම සහතික කරන්නැයි ශ්‍රී ලංකාවේ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින ලෙස සසප ආධාරකරුවන් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන් වෙත අපි යලිත් කැඳවුම් කර සිටිමු.

ලිපිය යැවිය යුත්තේ:

ගෝටාභය රාජපක්ෂ,
ආරක්ෂක ලේකම්,
15/5, බාලදක්ෂ මාවත,

කොලඹ 3, ශ්‍රී ලංකාව.
ෆැක්ස්ඃ 0094-11-2541529.
ඊ-මේල්: secretary@defence.lk

එන්.ජී. පුංචිහේවා,
අධ්‍යක්ෂ-පැමිනිලි හා පරීක්ෂන,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂම,
අංක 36, කින්සි පාර,
කොලඹ 8, ශ්‍රී ලංකාව,
ෆැක්ස්ඃ 0094-11-2694924.

ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත එවිය යුතු ය.
සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ. 1270,
කොලඹ. ශ්‍රී ලංකාව,
ඊ-මේල්: wswscmb@sltnet.lk

පහත පල වන්නේ ලැබී ඇති ලිපිවලින් තෝරාගත් කොටසකිඃ

ජුලි 27 දා කොලඹ දී පවත්වන ලද ලංකා ගුරු සංගමයේ වාර්ෂික සම්මේලනය පහත යෝජනාව ඒකමතිකව සම්මත කලේ යඃ

"පසුගිය මාර්තු 22 දින යාපන අර්ධද්වීපයේ කයිට්ස් ප්‍රදේශයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් අතුරුදන් වීම පිලිබඳව පූර්න වාර්තාවක් සැපයීමට ශ්‍රී ලංකාවේ ආන්ඩුව ක්‍රියා කල යුතු යයි ලංකා ගුරු සංගමයේ මෙම සම්මේලනය තරයේ කියා සිටී.

"නාවික හමුදාව විසින් දෙකොනෙහි මාර්ග බාධක පවත්වා ගෙන යමින් ද ඒවා අතර නිරන්තර මුර සංචාරයන් පවත්වා ගනිමින් ද රැකවල් කරනු ලබන පුංගුඩුතීව් දූපත සහ කයිට්ස් දූපත යා කෙරෙන මුහුදු වේල්ලට ප්‍රවිෂ්ට වීමෙන් පසු මොවුන් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මිලිටරිය සෘජුව ම වග කිව යුතු ය, නැතහොත් සම්බන්ධ ය. මේ පිලිබඳව සැලකිය යුතු සාක්ෂ්‍ය සමාජවාදී සමානතා පක්ෂය විසින් සොයා ගනු ලැබ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පල කරනු ලැබ ඇත.

"මොවුන් දෙදෙනා අතුරුදන් වී මාස පහක් ගතවී ඇතත් ආන්ඩුව හෝ මානව හිමිකම් කොමිසම ඒ සම්බන්ධයෙන් මේ දක්වා යථා පරීක්ෂනයක් පවත්වා නැත.

"විමලේස්වරන් සහ මදිවදනන්ගේ අතුරුදහන් වීම සම්බන්ධව ආන්ඩුව වග කිව යුතු යයි කියා සිටින මෙම සම්මේලනය ඔවුන්ව වහාම නිරුපද්‍රිතව නිදහස් කල යුතු යයි ආන්ඩුවට කියා සිටී.

"සසප ආධාරකරුවකු වූ සිවප්‍රගාසන් මරියදාස් පසුගිය අගෝස්තු 7 වෙනි දා නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල දිස්ත්‍රිකකයේ මුල්ලිපොතනේ පිහිටි ඔහුගේ ම නිවසේ දී ඝාතනය කිරීම ගැන විධිමත් හා බැරෑරුම් පරීක්ෂනයක් පැවැත්වීමට ආන්ඩුව හා අදාල බලධාරීහු මේ දක්වා අසමත්ව සිටිති.

"ඝාතනයෙන් පසුව මරියදාස් එල්ටීටීඊයේ සාමාජිකයෙක් යයි සාවද්‍ය කටකතා පැතිරවූ මිලිටරිය හා එය සමග සම්බන්ධ පැරා මිලිටරි කන්ඩායම් මෙම ඝාතනයට වගකිවයුතු බවට අඟවන්නා වූ සාධාරන හේතු පවතී.

"වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත් මෙම අපරාධය සම්බන්ධව කිසිවෙකු අත්අඩංගුවට ගැනීමට හෝ චෝදනා ඉදිරිපත් කිරීමට පොලීසිය අසමත් වීම ම මෙම කරුන බලගතු ලෙස සනාථ කරයි.

"මෙම අතුරුදන් කිරීම් සහ ඝාතනය වනාහී යුද්ධයට දැක්වූ විරුද්ධත්වයත් සෑම ආකාරයකම වර්ගවාදී දේශපාලනයට එරෙහිවත් සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීමට ගෙන ගිය අරගලයත් නිසා සසපට සහ මෙම පුද්ගලයන්ට එරෙහිව කරන ලද දේශපාලන අපරාධ යයි මෙම සම්මේලනය හෙලා දකී."

***

ප්‍රිය මහත්මයානනි,

නඩරාජා විමලේස්වරන්ගේ හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන්ගේ අතුරුදහන් වීම දැන ගැනීමෙන්, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* හා සමාජවාදී සමානතා පක්ෂයේ ආධාරකරුවකු ලෙස, මම බෙහෙවින් කනගාටුවට පත්වීමි. මෙය සිදු වූයේ සිය ගනන් ශ්‍රී ලාංකිකයන් "අතුරුදහන්වීමට" හෝ කෙලින් ම ඝාතනයට ලක්ව ඇති කැත සිවිල් යුද්ධයක සන්දර්භය තුල බව දැන ගැනීමෙන් මම භීතියට ද පත් වුනෙමි. නිලධාරින්ගෙන් අපට ලැබී ඇති එක ම ප්‍රතිචාරය අතිශය අසංවේදී නොතැකීම වන තතු තුල මට ඔබට දැන්වීමට අවශ්‍ය වන්නේ මෙම කරුන සම්බන්ධයෙන් අපට යුක්තිය ඉටු වන තෙක් නිහඬ නොවනු ඇති සිය ගනනක් සහෝදරවරු ලොව වටා සිටින බව යි. අපගේ මෙම ප්‍රයත්නයේ දී වහාම අපට උදව් කරන ලෙස මම ඔබගෙන් (හෝ ඔබගේ අමාත්‍යංශයේ සිටින සැලකිලිමත් ඕනෑම අයෙකුගෙන්) ඉල්ලා සිටිමි.

මීට,

හිතවත්,

කේ.එම්.

කැලිෆෝනියා, ඇමරිකා එක්සත් ජනපදය

© www.wsws.org